## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## A කොටස

| | | |
|---|---|---|
| (01) - 1 | (11) - 4 | (21) - 4 |
| (02) - 4 | (12) - 3 | (22) - 2 |
| (03) - 5 | (13) - 4 | (23) - 2 |
| (04) - 2 | (14) - 3 | (24) - 1 |
| (05) - 3 | (15) - 5 | (25) - 5 |
| (06) - 1 | (16) - 5 | (26) - 5 |
| (07) - 4 | (17) - 1 | (27) - 1 |
| (08) - 2 | (18) - 3 | (28) - 2 |
| (09) - 2 | (19) - 5 | (29) - 3 |
| (10) - 1 | (20) - 3 | (30) - 5 |

## B කොටස

31. (i) දේශාපලනය (ii) දේශපාලන විද්‍යාව
32. (i) ඇරිස්ටෝටල් (ii) මැක්ස්වේබර්
33. (i) නූතනවාදී ප්‍රවේශය (ii) චිරන්තනවාදී ප්‍රවේශය. (iii) මෙවලම්වාදී ප්‍රවේශය
34. (i) රාජ්‍යය පරමෝත්තම සංවිධානයකි - ෆැසිස්ට් රාජ්‍ය
    (ii) රාජ්‍යය සුභ සාධක සංවිධානයකි - ලිබරල් රාජ්‍යය
35. (i) ජනගහණ න්‍යාය - තෝමස් මෝල්කස්
    (ii) ස්වාභාවික තේරීම පිළිබඳ න්‍යාය - චාල්ස් ඩාවින්
36. (i) ආර්ථික සාධකයක් ලෙස (ii) දේශපාලන සාධකයක් ලෙස
37. (i) පෞද්ගලිකවාදය (ii) නීතිය හා සාමය ආරක්ෂා කිරීම (iii) වෙළඳපල බලවේග මගින් ආර්ථිකය හැසිරවීම
38. (i) ආණ්ඩු පිහිටුවීම (ii) අයවැය සම්මත කිරීමේදී (iii) විශ්වාසභංගයක් සම්මත කිරීමේදී
39. (i) ඇඩම්ස්මිත් (ii) ඩේවිඩ් රිකාඩෝ (iii) ජෝන් ස්ටුවට්මිල් (iv) තෝමස් මැල්තස්
40. (i) ප්‍රජා පීඩක පාලනයක් ඇතිවීම වැළැක්වීම (ii) පුද්ගල නිදහස ආරක්ෂා කිරීම
41. (i) ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශය (ii) මානව අවශ්‍යතා ප්‍රවේශය (iii) අනන්‍යතා අවශ්‍යතා ප්‍රවේශ
    (iv) ගැටුම් පරිවර්තන ප්‍රවේශය (v) ගැටලු විසඳීමේ ප්‍රවේශය
42. (i) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (ii) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය
43. (i) ජාතික හදිසි අවස්ථාව (ii) ප්‍රාන්ත හදිසි අවස්ථාව (iii) මූල්‍ය හදිසි අවස්ථාව
44. (i) අගමැති පුටුව කැබිනට් මණ්ඩලය (ii) ශ්‍රේෂ්ඨාධිකරණය
45. (i) ව්‍යවස්ථාදායකයක හා විධායක සභාව පිහිටුවීම.
    (ii) රාජ්‍ය වෙළඳ ඒකාධිකාරිය අහෝසි කොට තරඟකාරී වෙළඳපොල ක්‍රමය ස්ථාපිත කිරීම.
46. (i) දේශපාලන අත පෙවීම්වලින් රාජ්‍ය සේවය ආරක්ෂා කර ගැනීම.
    (ii) සුළුතර කණ්ඩායම් අතර විශ්වාසය ගොඩනැගීම.
47. (i) අධිකරණ සේවා උපදේශක මණ්ඩලය
    (ii) අධිකරණ සේවා විනය මණ්ඩලය
48. (i) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙන් (ii) 1972 ප්‍රථම ජනරජ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්
49. (i) පාර්ලිමේන්තුව (ii) ජනමත විචාවරණයකදී මහජනතාව
50. (i) 1987 - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
    (ii) ආණ්ඩුකාරධූරය

## I කොටස

01. දේශපාලනය යනු රාජ්‍ය හා ආණ්ඩු පාලනයකට පමණක් සීමා නොවී ජනතාව ප්‍රායෝගිකව සම්බන්ධ වන ක්‍රියාවලියක් බවත් පුරවැසි සහභාගිත්වයෙන් තොරව දේශපාලනයක් නොපවතින බවත් පිළිබඳව සිසුන් කරුණු දැක්විය යුතුය. මෙහිදී සාම්ප්‍රධායිකව දේශපාලනය යනු රාජ්‍ය හා ආණ්ඩුකරණය ට පමණක් සීමා වූ බවත්, නමුත් ප්‍රායෝගිකව සාමාන්‍ය ජනතාවද සහභාගි වන්නක් බව කිව යුතුය. එහිදී ප්‍රායෝගිකව පුරවැසියන් සහභාගි වන ඡන්දය දීම, පක්ෂවලට සම්බන්ධ විට විරෝධිතා දැක්වීම, සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය ආදිය විස්තර කරමින් පිළිතුර ලියා තිබිය යුතුය. (ලකුණු 20)

NWP-EXAM

02. (i) චර්යාවාදි ප්‍රවේශය හැඳින්වීම, එය යොදාගත් චින්තකයන්, එම ප්‍රවේශයේ ලක්ෂණ, මෑත කාලීන ප්‍රවණතා හා එහි යහපත් අයහපත් ලක්ෂණ තිබීම මුළු ලකුණු දීමට සුදුසුය (ලකුණු 10)

(ii) මෙහිදී දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම් හා ආයතන දෙක පිළිබඳ සිසුන් ගේ අවබෝධයත්, ඒ ආයතන දෙක එකිනෙකින් වෙනස් වන ආකාරය දක්වා තිබිය යුතුය. (ලකුණු 10)

03. මේ ප්‍රශ්නය තුලින් සිසුන්ගේ රාජ්‍ය පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක් කෙරේ. එහිදී රාජ්‍ය මනුෂ්‍ය සමාජයේ බලවත්ම ආයතනය වන බව දැක්වීම අපේක්ෂා කරයි. ඒ බව,

1. රාජ්‍යයේ සුවිශේෂී ලක්ෂණ ඇසුරින් හා
2. දේශපාලන චින්තකයන්ගේ මත ඇසුරින් ලියා තිබීම සාර්ථක පිළිතුරක් ලෙස සලකන්න. එනම් රාජ්‍ය ගොඩ නැගි ඇති සාධක හා ඒ අතරින් ස්වාධිපත්‍යය බලය ආදිය තුළින් බලවත් වන බවත් ඇරිස්ටෝටලියානු, වේබේරියානු ආදි අර්ථ වලින් බලවත් වන බවත් දැක්විය හැකි. (ලකුණු 20)

## II කොටස

04. යටත් විජිත පරිවර්තනය හඳුන්වා 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල සිට 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ දක්වා කාලය තුල සිදුවූ ප්‍රතිසංස්කරණ වලින් ලාංකීය සමාජය තුළ සිදුවූ දේශපාලන වෙනස්කම් සිසුන් අවධාරනය කළ යුතුය.
එහිදී 1833 ප්‍රතිසංස්කරණ ගැනත්, 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරන ගැනත් වැඩි අවධානයක් යොමු කළ යුතුය. සාර්ථක පිළිතුරක යටත් විජිත තත්ත්වයට පෙර තිබූ දේශපාලන තත්ත්වයද විග්‍රහ කර තිඉබීම වැඩි ලකුණු දීමට සැලකිලිමත් වන්න. (ලකුණු 20)

05. මෙම ප්‍රශ්නයේ (i) (ii) (iii) (iv) යන කොටස් 4 න්ම අපේක්ෂා කරන්නේ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේත් 1972 1 ජනරජ ආණ්ඩුක්‍රමය යටතේත් සිසුන්ගේ රාජ්‍ය සේවය හා අධිකරණ සේවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමය. ඒ සඳහා තම ව්‍යවස්ථා 2 ක යටතේ රාජ්‍ය සේවයත් අධිකරණ සේවයත් හඳුන්වා ඒවායේ ස්වාධිපත්‍යයට ඇති කළ විධි විධාන දක්වා තිබිය යුතුය. (10 x 2 = 20)

06. මේ ප්‍රශ්නය සංසන්දනාත්මක ප්‍රශ්නයකි. එහිදී 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේත් 1972 1 ජනරජ ආණ්ඩුක්‍රමයේත් ව්‍යවස්ථාදායකයත් පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කර එම ව්‍යවස්ථාදායකයන් වල ව්‍යවස්ථාදායක බලතල පිළිබඳ සැසඳීමක් කළ යුතුය. එහිදි 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයට වඩා 1972 ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථා දායකය බලවත් බව අවධාරණය විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන ද දක්වා සැසඳීම කර තබේනම් වැඩි ලකුණු වලට හේතුවකි. (ලකුණු 20)

07. මේ ප්‍රශනයේ අරමුණ 1978 ii ජනරජ ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකය හා විධායකන් 2 ක පිළිබඳව සිසුන්ගේ අවබෝධය මැන බැලීමය. එබැවින් ඒ ඒ ආයතන හඳුන්වා ඒවාට අදාල ව්‍යවස්ථාමය විධි විධාන දැක්විම සිදුකළ යුතුය. ඒ ඒ ආයතනවල ප්‍රායෝගික තත්ත්වය ද දක්වන්නේ නම් වැඩි ලකුණු දීමට හේතුවකි. (10 x 2 = 20)

## III කොටස

08. මේ ප්‍රශ්නයේ අරමුණ ලෝකයේ පවතින ආණ්ඩුක්‍රම මාදිලි අතරින් සන්ධීය මාදිලියේ ආණ්ඩුක්‍රම දෙකක් වන ඇමරිකානු ආණ්ඩුක්‍රමය හෝ ඉන්දියානු ආණ්ඩුක්‍රමය කෙටියෙන් හඳුන්වා ඒ ඒ ආණ්ඩුක්‍රම වලට දැකිය හැකි ලක්ෂණ විස්තර කිරීම අපේක්ෂා කෙරේ. (ලකුණු 20)

09. ගැටුමක් යනු කුමක්දැයි නිර්වචනය කොට, චින්තකයන්ගේ මත ඇසුරින්, ගැටුම් සාධන ක්‍රියාවලියට අදාල විධි විධාන කෙටියෙන් පැහැදිලි කිරීම අවශ්‍ය වේ. (ලකුණු 20)

10. මේ ප්‍රශ්නයේ (i) (ii) (iii) (iv) (v) යන කොටස් වල ලක්ෂණ හඳුන්වා සේවා විස්තර කිරිම අපේක්ෂා කෙරේ.
(10 x 2 = 20)